(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 179.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 සැප්තැම්බර් 10 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

33/2024

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ක්‍රීඩකයින්ගේ අභිවෘද්ධිය සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය සහ එහි ප්‍රතිශතය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ක්‍රීඩකයින්ගේ අභිවෘද්ධිය උදෙසා වෙන් කරන මුදල් ප්‍රමාණය ඉහළ නැංවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

140/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 සැප්තැම්බර් 30 දින සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම විසින් සිදු කරන ලද රුපියල් මිලියන 500ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් විශේෂ විගණන වාර්තාවක් නිකුත් කර ඇති බව දන්නේද;

(ii) එම ප්‍රසම්පාදනය යටතේ තෝරා ගන්නා ලද සමාගම කවරේද;

(iii) එම ප්‍රසම්පාදනය සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iv) උක්ත විගණන වාර්තාවේ ඇතුළත් නිර්දේශ කවරේද;

(v) එම නිර්දේශ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1413/2025

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නව තැපැල් කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මෙම වර්ෂයට අදාළව අයවැයෙන් වෙන්කර ඇති මුදල කොපමණද;

(ii) කිරාන් තැපැල් කාර්යාලය පෞද්ගලික ගොඩනැගිල්ලක ක්‍රියාත්මක වන බව දන්නේද;

(iii) කිරාන් තැපැල් කාර්යාලය සඳහා නව තැපැල් කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඒරාවූර්පත්තු වෙන්කලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මාවඩිවේම්බු ප්‍රදේශයේ තැපැල් කාර්යාලයක් නොමැති වීමෙන් වැඩිහිටියන් සහ වැන්දඹු කාන්තාවන් චිත්තාන්ඩි උප තැපැල් කාර්යාලයෙන් ඔවුන්ගේ දීමනා ලබා ගන්නා බව දන්නේද;

(ii) මාවඩිවේම්බු ප්‍රදේශයේ නව තැපැල් කාර්යාලයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන්නේද;

(iii) උප තැපැල් කාර්යාලයක් තැපැල් කාර්යාලයක් බවට උත්ශ්‍රේණිගත කිරීමට අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

2096/2026

ගරු නීතිඥ සරත් කුමාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්ගමුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පයිලේකන්ද වැවේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම යෝජිත ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා ඇස්තමේන්තුගත කර ඇති මුළු පිරිවැය කොපමණද;

(iii) ව්‍යාපෘතිය සඳහා රජය විසින් මේ වනවිට මුදල් ප්‍රතිපාදන වැය කර තිබේද;

(iv) එසේ නම්, මේ වනවිට වැය කර ඇති මුළු මුදල කොපමණද;

(v) ව්‍යාපෘතියේ සමස්ත ඉදිකිරීම් කටයුතුවලින් මේ වනවිට අවසන් කර ඇති ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2189/2026

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ‘ජාතික ආරක්ෂක අරමුදල’ පිහිටුවීමේ අරමුණු, නීතිමය පදනම සහ සංයුතිය කවරේද;

(ii) අරමුදලට සාමාජිකයින් පත් කර ගනු ලබන ආකාරය සහ අවශ්‍ය සුදුසුකම් කවරේද;

(iii) අරමුදලට මුදල් ලැබෙන ආකාරය සහ එහි වර්තමාන සාමාජිකයින් කවරේද;

(iv) නව සාමාජිකයින් පත් කරනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පසුගිය දශකය තුළ ලබාදී ඇති සේවාවන් කවරේද;

(ii) අරමුදල අභ්‍යන්තර/රාජ්‍ය විගණනයකට ලක්වන්නේද;

(iii) 2025 වාර්ෂික වාර්තාව සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබේද;

(iv) නොඑසේ නම්, අවසාන වරට ඉදිරිපත් කර ඇති වර්ෂය කවරේද;

(v) වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් සිදුවී තිබේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2026 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සහ ඒ සඳහා අමාත්‍යාංශයේ පරිපාලන නිලධාරියෙකු ස්ථිරව පත්කර තිබේද;

(ii) මෙම අරමුදල තවදුරටත් පවත්වාගෙන යා යුතු වන්නේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(iii) ඒ පිළිබඳව ඉදිරිපත් කර ඇති යෝජනා සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2192/2026

ගරු රුවන් විජේවීර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපනවේදී උපාධියක් රජයේ පාසලක ගුරු පත්වීමක් ලබා ගැනීම සඳහා මූලික සුදුසුකමක් ලෙස සලකනු ලබන්නේද;

(ii) එම උපාධි පාඨමාලාව සම්පූර්ණ කර මේ දක්වා ගුරු සේවයට බඳවාගෙන නොමැති රාජ්‍ය සහ පෞද්ගලික උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2194/2026

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් වෙත පාර්ලිමේන්තු සභා ගර්භය තුළ භාවිතය සඳහා ලබාදෙන හැන්සාඩ් වාර්තා, න්‍යාය පත්‍ර සහ අනෙකුත් ලිපිලේඛන මුද්‍රණය කිරීම සඳහා වාර්ෂිකව වැය වන මුදල කොපමණද;

(ii) එම ලිපිලේඛන ඩිජිටල් මාධ්‍ය ඔස්සේ ලබාදීම මඟින් කඩදාසි භාවිතය අවම කිරීම හෝ සම්පූර්ණයෙන් ඉවත් කිරීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම වැඩපිළිවෙළ නිම කිරීමට සැලසුම් කර ඇති දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2205/2026

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ස්වාධීන මහජන අභිචෝදක කාර්යාලයක් පිහිටුවීමේ අවශ්‍යතාවය රජය පිළිගන්නේද;

(ii) එසේ නම්, එම කාර්යාලය පිහිටුවීමේ අරමුණු කවරේද;

(iii) මෙම කාර්යාලයට පැවරීමට අපේක්ෂිත කාර්යභාරය කවරේද;

(iv) කාර්යාලය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත් සහ භෞතික සම්පත් පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2247/2026

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බටහිර වෛද්‍යවරුන් සහ ආයුර්වේද වෛද්‍යවරුන් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන ක්‍රමවේද වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අයත් ප්‍රධාන අංශ කවරේද;

(iii) බටහිර වෛද්‍යවරුන්ට සහ ආයුර්වේද වෛද්‍යවරුන්ට ගෙවනු ලබන වැටුප්, දීමනා සහ වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) බටහිර වෛද්‍යවරුන් සහ ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා ලබාදෙන වැටුප්, දීමනා සහ වරප්‍රසාද අතර විෂමතාවක් පවතින්නේද;

(v) එසේ නම්, එම විෂමතා අවම කිරීම සඳහා සහ දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය නියාමනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2269/2026

ගරු රුවන් මාපලගම මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් අඩු ආදායම්ලාභී පවුල් සඳහා 2025 සහ 2026 වර්ෂවල ඉදිකර ඇති නිවාස ඒකක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අඩු ආදායම්ලාභී පවුල් සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම දිස්ත්‍රික්කයේ 2027 වර්ෂයේ සිට 2029 වර්ෂය දක්වා කාලසීමාව තුළ අඩු ආදායම්ලාභී පවුල් සඳහා ඉදිකිරීමට සැලසුම් කර ඇති නිවාස ඒකක සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම එක් නිවාස ඒකකයකට ලබාදෙන ආධාර මුදල කොපමණද;

(v) නිවාස සඳහා ආධාර ලබාදෙන ප්‍රතිලාභීන් තෝරාගනු ලබන නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— දිට්වා සුළි කුණාටුවට මුහුණ දීම සඳහා පූර්ව සූදානමක් නොමැති වීම සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— දිට්වා සුළි කුණාටුවට මුහුණ දීම සඳහා පූර්ව සූදානමක් නොමැති වීම සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කර වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2026 ජනවාරි 21 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට තවදුරටත් කාලය අවශ්‍ය වන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබා දී ඇති කාලසීමාව, 2026 දෙසැම්බර් 19 දින දක්වා දීර්ඝ කළ යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය,— කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යටතේ තීරණය,— 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව පත් කරනු ලබන කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික, එකී පනතේ 13 වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අතර, ඒකාබද්ධ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු හෙයින් ද;

කොමිෂන් සභාව සඳහා පත් කරනු ලබන සාමාජිකයින් අතරින් සභාපතිවරයා ද ඇතුළුව අවම වශයෙන් තිදෙනෙකු (03) පූර්ණ කාලීන සාමාජිකයින් වශයෙන් පත් කිරීමට අදාළ පනතේ 5(5) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සභාපතිවරයා සහ සාමාජිකයින් වෙත පැවරෙන කාර්යභාරයේ වැදගත්කම ද සැලකිල්ලට ගනිමින්, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයින් වෙත පහත පරිදි පාරිශ්‍රමික සහ දීමනා ගෙවීම සඳහා 2026.08.10 දිනැති අංක 26/1522/819/010-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇති හෙයින් ද:—

(i) සභාපතිවරයා වෙත මාසිකව රු.135,000.00ක ද, සාමාජිකයින් වෙත මාසිකව රු.90,000.00ක ද පාරිශ්‍රමික ගෙවීමට;

(ii) සභාපතිවරයා සඳහා මාසිකව රු.6,000.00ක ද, සාමාජිකයින් වෙත රු.4,250.00ක ද සන්නිවේදන දීමනාවක් ගෙවීමට; සහ

(iii) මාසික ඉන්ධන හා ප්‍රවාහන දීමනාව පහත පරිදි ගෙවීමට:

| | ඉන්ධන දීමනාව | ප්‍රවාහන දීමනාව* |
|---|---|---|
| සභාපති | 220L | රු.50,000.00 |
| අනෙකුත් සාමාජිකයින් | - | රු.25,000.00 |

* සභාපතිට ප්‍රවාහන දීමනාව හිමි වන්නේ රජය විසින් රියදුරෙකු සහිත නිල වාහනයක් ලබාදිය නොහැකි අවස්ථාවන්හි දී පමණි.

ඊට අනුකූලව, 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ 13 වගන්තිය ප්‍රකාරව, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයින්ට ඉහත පරිදි පාරිශ්‍රමික සහ දීමනා රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ගෙවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

*2.

අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*10.

විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— "2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

13.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

14.

ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

15.

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

16.

කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

17.

ට්‍රෙඩ්සෝ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

2253/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වෛද්‍යවරුන් අතරින් පාරම්පරික, විශේෂ සහ සර්වාංග වෛද්‍යවරුන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පාරම්පරික වෛද්‍යවරුන්ගේ නිශ්චිත වෙද පරම්පරා වෛද්‍ය සභාව විසින් හඳුනාගෙන තිබේද;

(iv) එසේ නම්, හඳුනාගෙන ඇති වෙද පරම්පරා සංඛ්‍යාව කොපමණද;

(v) පසුගිය රජයන් යටතේ වෙද පරම්පරා පිළිබඳ සොයා බැලීම සඳහා ආයුර්වේද පර්යේෂණ ආයතනය වෙත විශේෂ ව්‍යාපෘතියක් සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(vi) එසේ නම්, ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(vii) එම ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(viii) එම ව්‍යාපෘතියෙන් ප්‍රගතියක් නොමැති නම්, ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

2254/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා ඉන්දියාව සමඟ විදුලි, ඩිජිටල්, ඉන්ධන නළ මාර්ග සහ ප්‍රවාහන සම්බන්ධතා වර්ධනය කර ගැනීම සුදුසු බව පිළිගන්නේද;

(ii) එම අරමුණින් 2025.04.05 දින හෝ ඊට ආසන්න දිනයකදී ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කර තිබේද;

(iii) එසේ නම්, එම එක් එක් ගිවිසුම මඟින් ඉටු කර ගැනීමට අපේක්ෂිත මූලික අරමුණු සහ ඉලක්ක කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ධනුෂ්කොඩි සහ තලෛමන්නාරම අතර පෝක් සමුද්‍ර සන්ධියේ උපායමාර්ගික යටිතල පහසුකම් කොරිඩෝව ඉදි කිරීමේ මෙතෙක් ලබා ඇති ප්‍රගතිය කවරේද;

(ii) කොටසක් ඉහළින් යන පාලමකින් සහ ඉතිරි කොටස මුහුද යට උමඟකින් යුත් භෞතික සම්බන්ධතාවක් ගොඩ නැඟීම සඳහා මේ වනවිට ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර සාකච්ඡාවක් ආරම්භවී තිබේද;

(iii) එම ව්‍යාපෘතියෙන් ශ්‍රී ලංකාවට සහ ඉන්දියාවට ලැබෙන ද්විපාර්ශ්වික වාසි කවරේද;

(iv) එම ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

2255/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය, බලශක්ති මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබේද;

(ii) එසේ නම්, එම ගිවිසුමේ පාර්ශ්වකරුවන් කවුරුන්ද;

(iii) එම ගිවිසුම මඟින් ඉටු කර ගැනීමට අපේක්ෂා කරන මූලික අරමුණු කවරේද;

(iv) එම අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂා කරන කාලරාමුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ගිවිසුම ප්‍රකාරව —

(i) ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර බහුනිෂ්පාදන ඉන්ධන නළ පද්ධතිය ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් මේ දක්වා ලබා ඇති ප්‍රගතිය කවරේද;

(ii) ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණ සංවර්ධනය කිරීම සඳහා අවබෝධතා ගිවිසුම අනුව මේ දක්වා ගෙන ඇති පියවර කවරේද;

(iii) ත්‍රිකුණාමලය ප්‍රදේශයේ තෙල් පිරිපහදුවක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් මේ දක්වා ලබා ඇති ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

2258/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර 2025.04.05 දින අත්සන් කරන ලද ආරක්ෂක සහයෝගිතා අවබෝධතා ගිවිසුම ප්‍රකාරව ඇති කර ගන්නා ලද එකඟතා කවරේද;

(ii) එම එකඟතා අතරින් මේ වනවිට ක්‍රියාත්මක කර අවසන් කර ඇති කටයුතු කවරේද;

(iii) ගිවිසුම පරිදි ඇති කරගන්නා ලද එකඟතාවයන් ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවී තිබේද;

(iv) එසේ නම්, එම ප්‍රමාදයට හේතු කවරේද;

(v) එම ගිවිසුම ප්‍රකාරව ඉන්දියාව සමඟ ඇති කරගෙන ඇති එකඟතාවයන් අනුව ක්‍රියා කිරීම සඳහා ප්‍රමුඛතාවයක් ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?